**සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම - 2016**
-----------------------------------------------------

සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තිය ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම
-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම
-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 සමාගම පිහිටුවීම හා සමාගමේ අයිතිය
--------------------------------------------

සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2012 අගෝස්තු 24 දින සංස්ථාගත කරන ලද සීමිත සමාගමක්වේ. මෙහි හිමිකාරීත්වය සියයට සියයක් රජය සතුවේ.

**1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.1.1 වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය සහ සීමාකිරීම් පහත දක්වා ඇති පරිදි වේ.

(ආ) - විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත් මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට, සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි විධිවිධාන ප්‍රකාරව 2012 වසරේදී පැල්වත්ත සීනි සමාගමේ ස්කාගාර අංශය විසින් අත්පත් කරගන්නා ලද රු. 760,763,929 ක ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය නොකර මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සෙවනගල සීනි සමාගමේ යල්පැනගිය සහ භාවිතයට ගත නොහැකි වත්කම් වෙන්වෙන්ව හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබු බැවින් මූල්‍ය ප්‍රකාශනවල වත්කම් සාධාරණ ලෙස ඉදිරිපත්කර නොතිබුණි.

(ආ) ප්‍රවර්තන වර්ෂය වෙනුවෙන් විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි.

(ඈ) සෙවනගල සීනි සමාගමේ ගිණුම්වල දක්වා තිබූ ඇතැම් තොග ශේෂයන් රු. 81,655,315 ක ඍණ අගයක් ගෙන තිබූ අතර එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල තොග වටිනාකමින් අඩුකර දක්වා තිබුණි.

(ඈ) විගණනයට අනුව විලම්බිත බදු වගකීම් ශේෂය රු. 153,121,987ක් වුවද සමාගම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණේ රු. 92,167,028 ක විලම්බිත බදු වත්කමකි.

(ඉ) සෙවනගල සීනි සමාගමේ ගොවීන්ගෙන් ලැබිය යුතු රු. 276,727,945 ක ශේෂය සඳහා ණයගැති කාල විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබූ අතර අයකර ගත නොහැකි වටිනාකම් වෙනුවෙන් බොල් ණය කපා හැරීමක් හෝ ඒ සඳහා වෙන් කිරීමක් සිදු කර නොතිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු රු. 19,168,293 ක ශේෂය තහවුරුකර ගැනීම සඳහා විගණනයට සාක්ෂි ඉදිරිපත් නොවීය.

(ආ) සමාගමේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී පැල්වත්ත හා සෙවනගල සීනි සමාගම් වල මූල්‍ය ප්‍රකාශනවලට සිදු කරන ලද ගැලපුම් සටහන් විගණනයට ඉදිරිපත් නොකල බැවින් ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි භාවය හා විශ්වාසවන්ත භාවය තහවුරු කිරීමට විගණනයට ප්‍රමාණවත් හා යෝග්‍ය විගණන සාක්ෂි නොතිබුණි.

(ඇ) සමාගමේ ප්‍රවර්තන වර්ෂය වෙනුවෙන් වූ රු. 177,050,274 ක ආදායම් බදු ප්‍රතිපාදනයේ ප්‍රමාණවත් බව තහවුරු කර ගැනීම සඳහා එය ගණනය කළ ආකාරය විගණනයට ඉදිරිපත් නොවුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

--------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් අයිතම 08 කට අදාල රු.339,630,179 ක ලැබිය යුතු ශේෂ හා ගිණුම් අයිතම 10 කට අදාල රු. 423,593,599 ක ගෙවිය යුතු ශේෂ පිළිවෙලින් අයකර ගැනීමට හා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

---------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවුනු අවස්ථා නිරීක්ෂණය විය.

| **නීති රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (අ) 2007 අංක 07 දරන සමාගම් පනත | |
| (i) 131 වගන්තිය | සමාගමේ 2015 මූල්‍ය වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාවෙහි පිටපතක්, එම වර්ෂයේ කොටස් හිමියන්ගේ රැස්වීමේ දින සිට වැඩ කරන දින 30ක් ඇතුළත සමාගමේ අධ්‍යක්ෂකවරයකු හා ලේකම්වරයා යන දෙදෙනාම විසින් අත්සන් කර සමාගම් රෙජිස්ට්‍රාර් වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුව ද සමාගම විසින් එසේ කර නොතිබුණි. |

(ii) 133 වගන්තිය

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ ශේෂ පත්‍ර දිනයේ සිට මාස 6 කට වඩා පසු නොවන සහ පූර්ව වාර්ෂික රැස්වීමෙන් පසු මාස 15 ක් ඉක්ම නොවන දිනයකදී පැවැත්වීම සඳහා කොටස් හිමියන්ගේ වාර්ෂික මහාසභා රැස්වීමක් කැඳවිය යුතු වුව ද සමාගම විසින් එසේ සිදු කර නොතිබුණි.

(ආ) 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනත 17 (1)(ඒ) වගන්තිය

සේවකයාගේ මාසික මුළු ඉපයීම් වලින් සේවක භාරකාර අරමුදලට දායක මුදල් ගෙවිය යුතු වුව ද සමාගමේ ප්‍රධාන කාර්යාලයේ සේවකයන් වෙනුවෙන් මූලික වැටුප පමණක් පදනම් කරගෙන අදාල ගෙවීම් සිදු කර තිබුණි.

(ඇ) 1998 සේවක අර්ථ සාධක අරමුදල් පනත (සංශෝධිත)

10 (2) වගන්තිය

සේවකයාගේ මාසික මුළු ඉපයීම් වලින් සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු වුව ද , සමාගමේ ප්‍රධාන කාර්යාලයේ සේවකයන් වෙනුවෙන් මූලික වැටුප පමණක් පදනම් කරගෙන අදාල ගෙවීම් සිදුකර තිබුණි.

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

9.3.1 ඡේදය

සෑම ආයතනයකටම අදාලව කාර්යමණ්ඩලය බඳවා ගැනීමේ පරිපාටියක් තිබිය යුතු වුවත්, සමාගමේ ප්‍රධාන කාර්යාලය හා ඊට අයත් සෙවනගල සහ පැල්වත්ත කර්මාන්තායතන සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියක් නොතිබුණි.

## 2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවුනු ගනුදෙනු

---------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යක්ෂ මණ්ඩලය නිසි ලෙස පත් කර නොමැති කාලපරිච්ඡේදය තුලදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශයන් අනුගමනය නොකර පැල්වත්ත සීනි සමාගම විසින් 2016 අගෝස්තු 23 දින රු.13,490,010 ක වටිනාකමකට උක් දඬු පැටවීමේ යන්ත්‍රයක් සහ 2016 නොවැම්බර් 28 දින රු.30,524,000 ක් වටිනා ට්‍රැක්ටර් රථ 10 ක් මිලට ගෙන තිබුණි. තවද එම මිලදී ගැනීම් සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තු ද පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාගමේ ප්‍රධාන කාර්යාලය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් හෝ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ව්‍යාපෘති සම්බන්ධීකරණ නිලධාරීන් 4 දෙනෙකු සහ රියදුරන් 3 දෙනෙකු සමාලෝචිත වර්ෂයේදී කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි. මෙම නිලධාරීන් විසින් සමාගම වෙනුවෙන් කිසිදු ව්‍යාපෘතියක් ආරම්භකර හෝ සම්බන්ධීකරණයක් කර නොතිබූ අතර රියදුරන් ඇතුලු එම නිළධාරීන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා ඇති වැටුප් හා දීමනා ප්‍රමාණය රු. 2,984,552 ක් විය.

(ඇ) සමාගමේ සභාපති විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් හෝ කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුවේ අනුමැතියකින් තොරව, සමාලෝචිත වර්ෂයේදී සමාගමේ ප්‍රධාන කාර්යාලය වෙනුවෙන් ව්‍යාපෘති කළමනාකරුවකු රු. 150,000 ක මාසික වැටුපකට බඳවාගෙන තිබුණි. බඳවාගත් දින සිට ඔහු විසින් කිසිදු නව ව්‍යාපෘතියක් ආරම්භ කර නොතිබුණද, වර්ෂයේ අවසාන මාස 5 ක් සඳහා එම නිලධාරියා වෙනුවෙන් ගෙවා ඇති වැටුප රු. 711,290 ක් විය.

## 3. මූල්‍ය සමාලෝචනය

----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.873,073,391 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,050,827,240 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,923,900,631 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ පිරිවැටුම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. 2,847,252,602 කින් එනම් සියයට 58 කින් වැඩි වීම, මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගමේ මුළු ආදායම වූ රු. බිලියන 7.8 න් , සියයට 99 ක් මෙහෙයුම් ආදායම් වලින් සමන්විත වී තිබුණි. සමාගමේ මුළු මෙහෙයුම් වියදම වූ රු. බිලියන 6.8 න් රු. බිලියන 5.5 ක් විකුණුම් පිරිවැය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී සමාගමේ ජංගම හා ක්ෂණික අනුපාතයන් පිළිවෙලින් 2.17 : 1 ක් හා 1.21 : 1 ක් විය. එය පෙර වර්ෂයේ දී පිළිවෙලින් 1.82 : 1 ක් හා 1.17 : 1 ක් විය. සමාලෝචිත වර්ෂයේදී සමාගමේ රු. මිලියන 1,327 ක ස්ථාවර තැන්පතු ජංගම වත්කම් යටතේ දක්වා තිබීම මෙම ද්‍රවශීලතා තත්ත්වය සතුටුදායක වීමට හේතු වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දී සමාගමේ දළ ලාභ අනුපාතය සියයට 28 ක් වූ අතර ශුද්ධ ලාභ අනුපාතය සියයට 13.1 ක් වී තිබුණි. එය පෙර වර්ෂයේදී පිළිවෙලින් සියයට සෘණ 4 ක් හා සියයට සෘණ 22 ක් වී තිබූ අතර සමාගමේ විකුණුම් පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 58 කින් වැඩි වීම මෙම ලාභදායිත්වය ඉහල යාමට මූලික හේතුව වී තිබුණි.

### 3.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

------------------------------------

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබූ රු. 529,528,543 ක බැංකු අයිරාව වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබූ පොලිය රු. 49,837,683 ක් විය. කෙටිකාලීන ණය සඳහා ඉහල පොළියක් ගෙවීමට සිදු වීමෙන් සමාගමේ කාරක ප්‍රාග්ධන කළමනාකරණය සතුටුදායක නොවන බව නිරීක්ෂණය විය.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**4.1** **කළමනාකරණ ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පැල්වත්ත සීනි සමාගම

(i) අලාභ ලබමින් පැවති සමාජ ශාලාව සහ ආගන්තුක නිවස අමතර ආදායම් ලබා ගැනීමේ අරමුණින් වෙනම ඒකකයක් ලෙස ස්ථාපිත කොට 2014 වර්ෂයේදී රු.28,163,089 ක වියදමක් නවීකරණය සහ අලුත්වැඩියා කටයුතු සඳහා වැය කර තිබුණි. කෙසේ වුවද, 2014 වර්ෂයේදී නිම කළ යුතු අලුත්වැඩියා කටයුතු සමාලෝචිත වර්ෂය තුල දී ද සම්පූර්ණ කර නොතිබුණි. සමාජ ශාලාව සහ ආගන්තුක නිවස 2016 වර්ෂය අවසන් වන විටත් අලාභ ලබන තත්ත්වයේ පැවති අතර සමාගම දැරූ පිරිවැයට සරිලන ප්‍රතිලාභයක් අත් කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව කළමනාකරණයේ ඒකමතික තීරණයක් අනුව 2013 වර්ෂයේ දී රු.128,910,000 ක වටිනාකමකට කල්බදු පහසුකම් යටතේ මිලට ගත් ක්‍රේන් යන්ත්‍රය සමාගම එකඟ වූ පරිදි කර්මාන්තායතනය තුල නිසි පරිදි ස්ථාපිත නොකිරීම නිසා එයින් කිසිදු ප්‍රයෝජනයක් ගත නොහැකි තත්ත්වයේ පැවතුණි. මෙම යන්ත්‍රය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී සමාගම විසින් ගෙවා ඇති කල්බදු වාරික වල වටිනාකම සහ පොලිය රු.28,509,183 ක් වූ අතර තවදුරටත් ඉදිරි වසර 3 ක් දක්වා පොලිය සහිතව ගෙවිය යුතු මුළු වාරික මුදල රු.48,903,588 ක් බැවින් මෙය නිෂ්කාර්ය වියදමක් බවට නිරීක්ෂණය විය.

(ආ) සෙවනගල සීනි සමාගම

(i) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ කර්මාන්තශාලාව විසින් මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතු වුවද, කර්මාන්තශාලාව හා ස්කාගාරය සඳහා බලපත්‍රයක් ලබා ගෙන නොතිබුණි. කර්මාන්තශාලාව තුලින් පිටවන අප ජලය පිරිපහදු කිරීම සඳහා යන්ත්‍ර යවි කිරීමට රු. 27,067,812 ක මුදලකට කොන්ත්‍රාත්තුවක් ලබා දී තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් එය නිම නොකිරීම නිසා අදාල බලපත්‍රය ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) ගැනුම්කරුවන් වෙත නිකුත් කරනු ලබන නිෂ්පාදිත එතනෝල් මැන බැලීම සඳහා පෞද්ගලික ආයතනයකින් රු.1,951,019 ක වටිනාකමකට මද්‍යසාර මැණුම් යන්ත්‍රයක් 2013 වර්ෂයේදී මිලදී ගෙන තිබුණි. යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය නිසි අන්දමින් සිදුවන බවට පරීක්ෂාවකින් තොරව මිලදී ගැනීම නිසා මෙම මීටරය මගින් නිවැරදි මිණුම් දත්ත ලබාදී නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය වන විටත් එය නිවැරදි කර ගැනීමට අදාල සමාගම සමඟ කටයුතු කර නොතිබුණි.

**4.2** **මෙහෙයුම් ක්‍රියාකාරකම්**

**-------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** **පැල්වත්ත සීනි සමාගම**

**--------------------------**

(i) කර්මාන්තශාලාවේ වාර්ෂික ඇඹරීම කළ හැකි උපරිම උක් ප්‍රමාණය උක් මෙට්‍රික් ටොන් 600,000 ( දිනකට 3,000 MT x මෙහෙයුම් දින 200) ක් වුව ද, 2012 වර්ෂයේ සිටම උපරිම ධාරිතාවය ළඟා කර ගැනීමට කර්මාන්තායතනය අපොහොසත් වී තිබුණි. 2016 වර්ෂයේ සත්‍ය වශයෙන් අඹරන ලද උක් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 416,340 ක් වූයෙන් භාවිතයට නොගත් ධාරිතාවය මෙට්‍රික් ටොන් 183,660 කි. එය සියයට 31 ක ප්‍රමාණයකි. මෙසේ උපරිම ධාරිතා මට්ටම ළඟා කර ගැනීමට සමාගම විසින් කටයුතු කළ යුතු බව නිරීක්ෂණය විය.

(ii) උක් දඬු යොදා ගනිමින් ලබා ගන්නා ප්‍රධාන නිෂ්පාදිතය වන සීනි නිපදවීමෙන් පසුව, එහි අතුරු ඵලයක් ලෙස එතනෝල් නිෂ්පාදනය කළ ද ඊට අමතරව නිෂ්පාදනය කළ හැකි වෙනත් අතුරු නිෂ්පාදන නිපදවා ලාභදායිත්වය වැඩි කර ගැනීමට සමාගමේ කළමනාකාරිත්වයේ අවධානය යොමු වී නොතිබුණි.

(iii) එතනෝල් නිෂ්පාදනාගාරයට අවශ්‍ය බලශක්තිය, සීනි නිෂ්පාදන ක්‍රියාවලියෙන් ඉවත ලන බැගෑස් ආධාරයෙන් නිපදවාගනු ලබන අතර එසේ නිපදවන බලශක්තිය ප්‍රමාණවත් නොවන විට furnace oil භාවිතා කර යන්ත්‍ර ක්‍රියා කරවනු ලබයි. ඒ සඳහා 2016 වර්ෂයේ දී සමාගම විසින් දරා ඇති වියදම රු.122,496,000 කි. එසේ වුව ද, මෙම පිරිවැය අඩු කර ගැනීම සඳහා විකල්ප බලශක්ති ක්‍රමයක් යොදා ගැනීමට හෝ නිපදවන බැගෑස් ප්‍රමාණය වැඩි කර ගැනීමට හෝ බොයිලේරු නවීකරණය කිරීම තුලින් බැගෑස් පුළුස්සා ලබා ගන්නා විදුලිය වැඩි කර ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි.

**(ආ)** **සෙවනගල සීනි සමාගම**

---------------------------

(i) පැල්වත්ත සීනි සමාගමේ පරිදි මෙම සමාගම විසින් බැගෑස් නිපදවීම සඳහා 2016 වර්ෂයේ දී දරා ඇති වියදම රු.159,882,624 ක් වූ අතර අදාල පිරිවැය අඩුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) ස්කාගාරයේ ආසවන අංශයේ ආසවනය සඳහා භාවිතා කරන කුළුණු ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම සහ මොලෑසස් වල පවතින අපද්‍රව්‍ය හා ජලය වැඩි වීම හේතු කොට ගෙන නිෂ්පාදිත එතනෝල් වල ප්‍රමිතිය අඩු මට්ටමක පැවතීම නිසා පැල්වත්ත සීනි සමාගමේ මිලට වඩා අඩු මිලකට එතනෝල් අලෙවි කිරීමට සිදු වී තිබුණි. මේ අනුව ප්‍රමිතිය ඉහල නංවා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග සමාගම විසින් ගෙන නොතිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 අගෝස්තු 08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සීමාසහිත සීනි පුද්ගලික සමාගම යටතට පැල්වත්ත හා සෙවනගල සීනි සමාගම් පවරාගෙන තිබුණද කන්තලේ සහ හිඟුරාන කර්මාන්තායතන එසේ පවරාගෙන නොතිබුණු අතර කන්තලේ සීනි කර්මාන්තායතනය මේ වන විට අක්‍රිය තත්ත්වයේ පැවතුණි.

(ආ) 2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත යටතේ පැල්වත්ත හා සෙවනගල සමාගම් වලට අයත් ඉඩම් හා එයට අයත් කර්මාන්තශාලා හා ගොඩනැගිලි යනාදී නිශ්චල දේපළ පමණක් රජයට පවරා ගෙන තිබුණි. ඊට අමතරව සමාගම් දෙකම සතු පිරියත, යන්ත්‍රෝපකරණ, තොග ආදී චංචල දේපළ පවරා ගැනීමකින් තොරව එදිනෙදා මෙහෙයුම් කටයුතු වෙනුවෙන් යොදාගෙන තිබුණි. පවරාගන්නා ලද වත්කම් පිළිබඳ ලැයිස්තුවක් සමාගම සතුව නොතිබුණු අතර ස්ථාවර වත්කම් යටතේ දක්වා ඇති වත්කම් වලින් සමාගම් දෙකට අයත්ව පැවති වත්කම් වෙන්ව හඳුනාගත නොහැකි විය.

**4.4 ආර්ථික නොවූ ගනුදෙනු**

පැල්වත්ත සීනි සමාගමට අයත් ගොඩනැගිල්ලක් ලංකා බැංකුව පැල්වත්ත ශාඛාව වෙත ලබා දී තිබුණ ද ඒ සඳහා ගිවිසුමක් නොවූ අතර ඊට අදාල කුලී මුදල් අයකර ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි. තවද බැංකු ශාඛාවේ විදුලි හා ජල බිල්පත් සමාගම විසින් ගෙවා තිබූ අතර එම මුදල අයකර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට කටයුතු කිරීමකින් තොරව කළමනාකරණ මට්ටමේ නිලධාරින් කෙටිකාලීන කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන එම පත්වීම් නැවත නැවත දීර්ඝ කර තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පිඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත්, සමාගම විසින් කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2017 මාර්තු 23 වන දිනදී ය.

**5.2 අභ්‍යන්තර විගණනය**

සෙවනගල සීනි සමාගමේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් එම සමාගමේ සීනි කර්මාන්තශාලාවේ සහ ස්කාගාරයේ මෙහෙයුම් කටයුතු ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**5.3** **ප්‍රසම්පාදන සැලැස්ම**

-----------------------

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව සමාගම විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.4** **අයවැය ලේඛනමය පාලනය**

------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.5 ඡේදය පරිදි ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවසාන අයවැය ලේඛනයේ පිටපතක් අදාල වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2017 වර්ෂය සඳහා සකස් කරන ලද වාර්ෂික අයවැය ලේඛනයේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**6.** **පද්ධති හා පාලනයන්**

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව සමාගමේ සභාපති වෙත වරින්වර අවධානය යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** |
|---|---|---|
| (අ) | පිරිවැය හා මූල්‍ය ගිණුම්කරණය | ක්‍රමවත් පිරිවැය හා මූල්‍ය ගිණුම්කරණ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම. |
| (ආ) | තොග පාලනය | තොග සඳහා කාල විශ්ලේෂණයක් සිදුකර යල් පැනගිය තොග හඳුනාගෙන ප්‍රතිපාදන වෙන් කිරීමක් හෝ තොග කපා හැරීමක් සිදුකර නොතිබීම. |
| (ඇ) | ලැබියයුතු හා ගෙවිය යුතු ගිණුම් | ණයගැති කාල විශ්ලේෂණයක් සිදුකර බොල්ණය හා අඩමාන ණය ප්‍රතිපාදන වෙන්කර නොතිබීම සහ දිගුකාලීන ණය ශේෂ හා ගෙවිය යුතු වියදම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබීම. |
| (ඈ) | මානව සම්පත් කළමනාකරණය | අනුමත බඳවාගැනීමේ පරිපාටියක් නොතිබීම සහ සෙවනගල සීනි සමාගමේ පැරණි නිලධාරින් වෙනුවෙන් පෞද්ගලික ලිපිගොණු නඩත්තු කර නොතිබීම. |
| (ඉ) | ප්‍රසම්පාදනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුගමනය කර නොතිබීම. |